ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (විශේෂ අවශ්‍යතා අධ්‍යාපන) ගෞරව උපාධි වැඩසටහන

5 වන මට්ටම 2020/2021

අවසාන පරීක්ෂණය - 2021

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ දාර්ශනික පදනම - SNU5336/ESU3136

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2021.07.31 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. විවිධත්වයෙන් යුත් පන්ති කාමරයක උගන්වන ගුරුවරුන් සඳහා අධ්‍යාපන දර්ශනය වැදගත් වන්නේ මන්දැයි සාධාරණීකරණයන් පහක් (05) දක්වන්න.

02. මාරියා මොන්ටිසෝරි අධ්‍යාපන දර්ශනයේ මූලික මූලධර්ම පහක් (05) සඳහන් කර එම මූලධර්ම විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ට අන්තර්කරණ පන්ති කාමරයක දී ක්‍රියාත්මක කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

03. අන්තර්කරණ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පාරිසරික වැදගත්කම කුමක්දැයි යන්න සුදුසු උදාහරණ ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න.

04. ලිබරල්වාදී පර්යාලෝකයන්ට අනුව අධ්‍යාපනයේ ප්‍රධාන කාර්යය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

05. අධ්‍යාපන පද්ධතිය තුළ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් ඒකීයකරණය කිරීමේ අරමුණ කෙටියෙන් පැහැදිලි කරන්න.

06. පාසල් පද්ධතිය තුළ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ට අන්තර්කරණ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා, ශ්‍රී ලංකාවේ අන්තර්කරණ අධ්‍යාපනය සංවර්ධනය කරන කණ්ඩායමකට නිර්දේශයන් පහක් (05) ලැයිස්තු ගතකරන්න.

12. (i) ප්ලේටෝ විසින් නිර්දේශ කරන ලද අධ්‍යාපන ක්‍රමය පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්ගේ අධ්‍යාපනය සඳහා යාවජීව අධ්‍යාපන ක්‍රමය වැදගත් භූමිකාවක් ඉටු කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 12)

13. (i) සාරධර්ම අධ්‍යාපන පද්ධතිය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) ශ්‍රී ලංකාවේ අන්තර්කරණ අධ්‍යාපනය වැඩිදියුණු කිරීමට සාරධර්ම අධ්‍යාපනයේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 12)

14. (i) දුබලතා සහිත සිසුන්ගේ විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ සංකල්පය සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් සඳහා අධ්‍යාපනය ලබාදීම සඳහා අන්තර්කරණ අධ්‍යාපනය වඩාත් නිර්දේශිත ක්‍රමයක් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 12)

හිමිකම් ඇවිරිණි.